සියලු ම හිමිකම් ඇවිරිණි/ All Rights Reserved

විශාඛා විද්‍යාලය කොළඹ - 05
Visakha Vidyalaya , Colombo - 05

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

| ඉතිහාසය I<br>History I | 10 ශ්‍රේණිය<br>Grade 10 | කාලය පැය එකයි<br>Time -One hour |
|---|---|---|

නම / අංකය : ..............................................................................................

සැලකිය යුතුය.
- ❖ සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ❖ අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවලට දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ❖ ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

1. ශ්‍රී ලංකාවේ සිතියමක් අඳින ලද මුල්ම ග්‍රීක ජාතිකයා වන්නේ,
   (1) ඩිමුන්ඩෝ ය (2) ටොලමි ය (3) ප්ලිනි ය (4) මෙගස්තිනිස් ය.

2. ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමට යොදාගත හැකි සාහිත්‍ය මූලාශ්‍රය බෙදා දැක්විය හැකි ප්‍රධාන කොටස් දෙක වන්නේ,
   (1) දේශීය හා විදේශීය (2) තඹපත් හා සෙල්ලිපි
   (3) වංස කථා හා ධර්ම ග්‍රන්ථ (4) සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක

3. "වංසත්ථප්පකාසිනී" කවර වංශකථාවකට ලියන ලද ටීකාවක් ද?
   (1) දීපවංශය (2) ථූපවංශය
   (3) මහාවංශයේ මුල් කොටස (4) ධාතුවංශය

4. පනාකඩුව තඹ සන්නස සම්බන්ධව නොගැළපෙන පිළිතුර සහිත ප්‍රකාශය තෝරන්න.
   (1) අනුරාධපුරය යුගයට අයත් මූලාශ්‍රයකි.
   (2) පළමු විජයබාහු රජු පිළිබඳ තොරතුරු සඳහන් වේ.
   (3) ක්‍රි.ව. 12 වන සියවසයේ ඉතිහාසය හැදෑරීමට ඉවහල් වේ.
   (4) සිත්තරු බිම බුදල්නා නම් නිලධාරියාට පිරිනමන ලද්දකි.

5. පැරණි ජනතාව විසින් නිර්මාණය කරන ලද හෝ පරිහරණය කරන ලද හෝ දැනට ඉතිරිව ඇති දේ හඳුන්වන්නේ කවර නමකින් ද?
   (1) අභිලේඛන (2) සෙල්ලිපි
   (3) පුරාන තඹපත් (4) පුරාවස්තු

6. අවධි කිහිපයකට අයත් පුද්ගලයන් නව දෙනෙකුගේ ඇටසිකිලි කොටස් සොයාගත් ස්ථානයක් වන්නේ මින් කුමක් ද?
   (1) බටදොඹ ලෙන (2) කිතුල්ගල බෙලිලෙන
   (3) පාහියංගල (4) අලුලෙන

7. වසර 80,000 ක් පැරණි බොරලු තට්ටුවක් මත පිහිටි ගල් මෙවලම් හමු වී ඇති ප්‍රදේශ කුමක් ද?
   (1) බූන්දල (2) පාහියන්ගල
   (3) පතිරාජවෙල (4) උඩමලල



EXAMRESULTS.LK

8. පූර්ව ඓතිහාසික යුගයට අයත් ශිලා මංජුසා සොහොන් පිහිටි ස්ථාන පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) හල්දුම්මුල්ල , බෙරගල
(2) යටිගල්පොත්ත, ගල්සොහොන් කනත්ත
(3) ඉබ්බන්කටුව, බෙරගල
(4) රංචාමඩම, හල්දුම්මුල්ල

9. ක්‍රි.පූ. 250 තරම් ඈත කාලයකදී රචිත බ්‍රාහ්මී සෙල්ලිපියක නගරයේ ප්‍රධාන වාස්තු ශිල්පියා හඳුන්වා ඇත්තේ.

(1) කුඩින්
(2) නගරවුඩික
(3) පුරකමත
(4) නගර ගුතික

- පහත ප්‍රකාශ ඇසුරින් 10 හා 11 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - මැටි බඳුනට දහයියා පුරවා පිලිස්සීම
B - පදම් කළ මැටි භාවිත කිරීම
C - සුසාන ගර්භයට මැටි තල සවි කිරීම
D - පොළොවට ලම්බාකාර බිත්ති බැඳීම

10. අතීතයේ දහනය සඳහා වායුව අවශ්‍ය යැයි දැන සිටි බව තහවුරු කෙරෙන ප්‍රකාශය කුමක්ද?

(1) C
(2) D
(3) B
(4) A

11. අතීතයේ නිවාස තැනීමේ තාක්ෂණය දැන සිටි බව තහවුරු කරන ප්‍රකාශය කුමක් ද?

(1) A
(2) B
(3) C
(4) D

12. මෙරට ඉතිහාසයේ ප්‍රථම වරට සංවිධානාත්මක සටන් ව්‍යාපාරයක් දියත් කිරීමේ ගෞරවය හිමිවන්නේ,

(1) දුටුගැමුණු රජුට ය.
(2) පණ්ඩුකාභය රජුට ය.
(3) වළගම්බා රජුට ය.
(4) වසභ රජුට ය.

13. ක්‍රි.පූ. 3 වන සියවසේදී සමනල වැව ප්‍රදේශයේ යකඩ නිස්සාරණයේදී උදුන් දැල්වීම සඳහා භාවිතා කර ඇත්තේ,

(1) ස්වභාවික සුළං බලය
(2) ගල් අඟුරු
(3) මරං ගස්වලින් ලබාගන්නා දර
(4) ලිමොනයිට් හා හෙමටයිට් ගල්

14. ඓතිහාසික යුගයේ මූලික ජනාවාස ගංගා නිම්නවලට පිටතින් පිහිටි ප්‍රදේශවල පැතිරී තිබීමට ප්‍රධාන හේතුවක් වනුයේ,

(1) වෘත්තීන් පදනම් කරගෙන ගම් ව්‍යාප්ත වී තිබීමයි.
(2) ගංවතුර පාලනය කිරීමට සරිලන තාක්ෂණයක් නොදැන සිටීමයි.
(3) හේන් වගා කිරීමට වර්ෂා ජලය පමණක් ප්‍රයෝජනයට ගැනීමයි.
(4) ගංගා නිම්නය පිටත ප්‍රදේශවල පස වගාවට සුදුසු වීමයි.

15. • වත් පොහොසත්කම
• කණ්ඩායමක් ලෙස නිවැරදි ආකාරයට හැසිරවීම
• කණ්ඩායමේ පොදු විශ්වාසය දිනා ගැනීම

ඉහත කරුණු කෙරෙහි සැලකිලිමත් වෙමින් තෝරා ගන්නා ලද නායකයා කවුද?

(1) ගමික
(2) ගහපති
(3) පරුමක
(4) මපුරුමක

16. පරුමකවරුන්ට කිසියම් ආකාරයක ප්‍රාදේශීය බලයක් හිමිව තිබූ බව පෙන්වා දීමට උපයෝගී කරගත හැකි සෙල්ලිපිය තෝරන්න.

(1) කොරවක්ගල සෙල්ලිපිය
(2) කණ්ඩලම සෙල්ලිපිය
(3) කන්දිය පොකුණ සෙල්ලිපිය
(4) පෙරියකුලම සෙල්ලිපිය

17. වැඩිවන ජන සංඛ්‍යාවට සාපේක්ෂව ආහාර නිෂ්පාදනය වැඩි කිරීමට ප්‍රමාණවත් ජල පහසුකම් නොමැති වීමේ අභියෝගයට මුහුණ දීම සඳහා පුරාණ වැසියන් ගන්නා ලද ක්‍රියාමාර්ගයක් වන්නේ මින් කුමක් ද?
(1) ඇළ මාර්ග ඉදි කිරීමයි.
(2) ගංගා හරස් කර අමුණු බැඳීමයි
(3) ගම් වැව් ඉදිකිරීම
(4) වැව් පද්ධති බිහි කිරීමයි.

18. පහත 'අ' සහ 'ආ' හිරුව නිවැරදිව ගළපා ඇති පිළිතුර තෝරන්න.

| 'අ' | 'ආ' |
|---|---|
| 1. කසිකාරගාම | A - වඩුවන් විසූ ගම |
| 2. වඩ්ඩකීගාම | B - ගොවියන් විසූ ගම |
| 3. කුම්භකාරගාම | C - ධීවරයන් විසූ ගම |
| 4. කොට්ටගාම | D - වළං තනන්නන් විසූ ගම |

(1) BADC
(2) CDAB
(3) DABC
(4) ABCD

19. මුල් ඓතිහාසික යුගයේ වර්ෂා ජලයෙන් පෝෂණය වී ඇළ මාර්ගවලින් එකිනෙකට සම්බන්ධ වී වැව් පද්ධති හැඳින්වීමට වියළි කලාපයේ ජනතාව භාවිත කළ නම කුමක් ද?
(1) වැව් ජාලය
(2) වැව්ගොඩ
(3) වැව් පද්ධතිය
(4) එල්ලංගාව

20. සැතපුම් 7 ක් දිග උස අඩි 44 ක් වන ශක්තිමත් වැව් බැම්මක් තනා ඇත්තේ.
(1) පදවිය වැව
(2) සීගිරිය මහ වැව
(3) මින්නේරිය වැව
(4) යෝධ වැව

21. ජනතා විශ්වාසය ගොඩනගා ගෙන මෙරට පාලනය කළ විදේශ සම්භාවිතාවයක් ඇති රජවරුන් දැක්වෙන පිළිතුර.
(1) වසභ රජු -එළාර රජු
(2) නිශ්ශංකමල්ල - වළගම්බා
(3) එළාර රජු - නිශ්ශංකමල්ල
(4) එළාර රජු - වංකනාසික තිස්ස රජු

22. "කාල සුමන" නමින් හැඳින් වූ පැරණි වෙළෙඳපොළ හමුවන්නේ කුමන ප්‍රදේශයෙන් ද?
(1) අනුරාධපුරය
(2) පොළොන්නරුව
(3) මාගම
(4) හෝපිටිගම

23. මීට වසර 2000 කට පමණ පෙර නීතිය පිළිබඳ හසල දැනුමක් ඇති වෘත්තිකයන් හඳුන්වා ඇත්තේ කුමන නමකින් ද?
(1) ලපන
(2) වෙජ
(3) වොහාර
(4) කබර

24. තිරුකේතීශ්වරම් හින්දු කෝවිල පිහිටා ඇත්තේ කුමන වරාය අසල ද?
(1) ගෝකණ්ණ
(2) ගොඩවාය
(3) මාතොට
(4) දඹකොළ පටුන

25. ඇළහැර ඇළෙන් ජලය ලබාගන්නා වැව් දෙකක් සඳහන් පිළිතුර තෝරන්න.
(1) මින්නේරිය වැව - ගිරිතලේ
(2) තිසා වැව - මින්නේරිය වැය
(3) කලා වැව - තිසා වැව
(4) ගිරිතලේ වැව - තිසා වැව

26. ක්‍රි.ව. 9 වන සියවසේදී රචනා කරන ලද සෙල්ලිපියක බල්ලා සහ කපුටා යන සලකුණු මගින් නිරූපණය වන්නේ,
(1) රාජකීයත්වය
(2) දීමනාවේ පිරිසිදු බව
(3) දීමනාව ඉරහඳ පවතින තාක් පවතින බව
(4) දීමනාව බාධාවන් කරන්නවුන් පිළිබඳව

27. අතීතයේදී ''සෙරෙන්ඩිබ්'' ලෙස ලංකාව හඳුන්වා ඇත්තේ කුමන ජාතිකයන් විසින් ද?

(1) අරාබි (2) රෝම (3) ග්‍රීක (4) පර්සියානු

28. සෙල්ලිපිවල 'අලකපය මහරජ' හෙවත් ආලකමන්දාධිපති මහරජු යනුවෙන් හඳුන්වනු ලැබුවේ.

(1) නිශ්ශංකමල්ල (2) දෙවන සේන

(3) දුටුගැමුණු (4) පළමු කාශ්‍යප

29. අතීත ශ්‍රී ලංකාවේ රජවරු ඉස්ලාමීය රජවරු සමග තෑගි හුවමාරු කරගත් බව සඳහන් කර ඇති අරාබි ජාතික ඉතිහාසඥයා කවුරුන් ද?

(1) සුලෙයිමාන් (2) ඉබන්බතුතා (3) ඉබන් හරියර් (4) අල්-බල සූරි

30. ක්‍රි.පූ. දෙවන සියවසයට අයත් සෙල්ලිපියක ''අඩික'' යනුවෙන් හඳුන්වා ඇත්තේ.

(1) භික්ෂූන්ට ගල් ගුහා පූජා කළ පරුමකවරයෙකි.

(2) වෙළෙඳාමේ යෙදී සිටි අයෙකි.

(3) ඇළ මාර්ග සම්බන්ධයෙන් කටයුතු කළ අයෙකි.

(4) නීතිය පිළිබඳ හසල දැනුමක් තිබූ අයෙකි.

31. ස්වභාවික ගල් පතුරු භාවිතා කොට සොරොව් ඉදිකර ඇති පැරණි වැව්වල ජලය මුදා හැරීමට භාවිත කළ සිරස්ගල් කුළුණු හැඳින්වෙන්නේ කුමන නමකින් ද?

(1) මොහොල් නගා (2) දියකැට පහණ

(3) වජ්‍ර වුම්බට (4) ගාවුත කණු

32. • අකුණුවලින් ආරක්ෂා වීමට වජ්‍ර චුම්බව සවි කර තිබීම

• දැවැන්ත ගඩොල්වල බර දරා සිටීමට හැකි අත්තිවාරම් දැමීම

මේ කරුණු කුමන වාස්තු විද්‍යාත්මක නිර්මාණයක් හා ගැළපේ ද?

(1) ජේතවන විහාරය (2) ලෝවාමහාපාය

(3) රුවන්වැලි සෑය (4) අභයගිරිය

33. අනුරාධපුර නගරයට උතුරින්, බටහිරින්, නැගෙනහිරින් පිහිටි වරායන් වන්නේ,

(1) සලාවත්තොට, මහාතිත්ත, ගෝකණ්ණ

(2) ගෝකණ්ණ, මහාතිත්ත,කාල තිත්ත

(3) ජම්බුකොළ පට්ටන, මහාතිත්ත, ගෝකණ්ණ

(4) දඹකොළ පටුන, මහාතිත්ත, සලාවත්තොට

34. I තීරුවේ දැක්වෙන සෙල්ලිපි මගින් පනවා තිබූ නීති II තීරුවේ සඳහන් කර ඇත. I තීරුවේ අනුපිළිවෙළට II තීරුව සමග ගළපා නිවැරදි පිළිතුර තෝරන්න.

| I තීරුව | II තීරුව |
|---|---|
| (1) සොරබොර වැව වැම් ලිපිය | A - උස් ගොඩබිම් ඉඩම්වල කැටැ |
| (2) වේවැල්කැටිය සෙල්ලිපිය | B - නිසි කලට සී සෑම නොකරන්නේ නම් දඩ ගෙවිය යුතුය. |
| (3) අනුරාධපුර පුවරු ලිපිය | C - පොහොය දිනවල වෙළඳාම් කළහොත් බදු ගෙවිය යුතුය. |
| (4) කොන්ඩවට්ටවාන් ලිපිය | D - මිනී මැරීමට දඬුවමට එල්ලා මැරීම |

35. පහත 'අ' තීරුවේ දැක්වෙන පැරණි මිනුම් ක්‍රම 'ආ' තීරුවේ දැක්වෙන මිනුම් ඒකක සමඟ නිවැරදිව ගළපා පිළිතුර තෝරන්න.

| 'අ' | 'ආ' |
|---|---|
| | A - කෙටි දුර පැනීම |
| (1) ගව්ව | B - දිගු දුර මැනීම |
| (2) කළඳ | C - අවකාශය මැනීම |
| (3) වියත | D - බර මැනීම |
| (4) කරීසය | E - කාලය මැනීම |

(1) ACBD (2) ADEC (3) BDAC (4) CDAB

36. ක්‍රි.ව. නව වන සියවසේදී රටේ පාලන තන්ත්‍රය හා සම්බන්ධ වූ ව්‍යවහාරයක් වදාළ යන පදයෙන් දක්වා ඇත. ඉන් අදහස් වන්නේ,
(1) නීති සම්පාදනය කරන ව්‍යවස්ථාදායකය වේ.
(2) නඩු අසන අධිකරණයයි.
(3) රජතුමාගේ අණ පනත් ය.
(4) භික්ෂූන් වහන්සේලාගේ දේශනාය

37. පැරණි නාගරික සැලසුම් පිළිබඳව අධ්‍යයනය කිරීමේදී හෙළිවන තොරතුරු අනුව මුල්ම සැලසුම්ගත නගර නිර්මාණය කිරීමේ ගෞරවය හිමි වන්නේ මෙම රජතුමාටයි.
(1) දුටුගැමුණු (2) I විජයබාහු (3) දේවානම්පියතිස්ස (4) පණ්ඩුකාභය

38. අනුරාධපුර අභයගිරි කැණීම්වලදී හමු වූ ලෝහ කැබැල්ලෙහි 'රත් යනුවෙන් ලියා තිබීමෙන් පැහැදිලි වන්නේ,
(1) විදේශීය සම්භවයක් සහිත කාසි හමු වූ බවයි.
(2) විනිමය කටයුතු වලදී කාසි වෙනුවට රන් ලෝහ භාවිත කළ බවයි.
(3) අභයගිරි විහාරයට ජනතාව රත්රන්වලින් ප්‍රරෝපකාර පැවැත් වූ බවයි.
(4) ආගමික කටයුතුවලදී රත්රන් භාවිත කළ යුතු බවයි.

39. අපගේ බුද්ධ ප්‍රතිමා හා ඇතැම් වාස්තු විද්‍යාත්මක නිර්මාණවල අග්නිදිග ආසියාතික ලක්ෂණ ඉස්මතු වී ඇත. එය දිය හැකි නිදසුනක් වන්නේ,
(1) අවුකන පිළිමය
(2) පොළොන්නරු ගල් විහාරයේ ප්‍රතිමා
(3) තොළුවිල පිළිමය
(4) සමාධි පිළිමය

40. රේගු බදු අය කර ගැනීම මෙවර සිදුකළ බවට තොරතුරු හෙළිවන පැරණි වරාය පිහිටි ස්ථානය වූයේ,
(1) කළු
(2) ගොඩවාය
(3) මහාතිත්ත
(4) ගෝකණ්න

සියලු ම හිමිකම් ඇවිරිණි/ All Rights Reserved

# විශාඛා විද්‍යාලය කොළඹ - 05
# Visakha Vidyalaya , Colombo - 05

දෙවන වාර පරීක්ෂණය - 2025
**Second Term Test - 2025**

083

| | | |
|---|---|---|
| ඉතිහාසය II<br>History II | 10 ශ්‍රේණිය<br>Grade 10 | පැය තුනයි.<br>*Three hours* |

නම / අංකය : ..........................................................................................................

**උපදෙස්**

- **I** කොටසින් පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- **II** කොටසින් ප්‍රශ්න පහක් තෝරාගෙන පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන හයකි.

## I කොටස

(01) (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද (ii) යටතේ දක්වා ඇති ස්ථාන සියල්ලම ලෝක සිතියමෙහි ලකුණු කර නම් කරන්න.

(i) මල්වතුඔය, පාහියංගල, ගල්ඔය, සීගිරිය, කෝනේෂ්වරම්, ලංකා පටුන, යෝධ වැව, ගොඩවාය, රාවණා ඇල්ල, බෙල්ලන්බැඳි පැලැස්ස, මිණිපේ ඇළ, මිහිනාගල් කන්ද
(ලකුණු 12)

(ii) ගෝව, පර්සියන් බොක්ක, මධ්‍යධරණී මුහුද, සුමාත්‍රා, අරාබිය, ග්‍රීසිය
(ලකුණු 6)

(ආ) පහත A, B, C, D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු වලට අදාළ පිළිතුරු අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

A - ශ්‍රී ලංකාවේ නොයෙක් ප්‍රදේශවල ගල්වල කොටා ඇති ඉර හඳ, වටාපත, හක්ගෙඩිය, ඇත් අඩිය හා සත්ව රූප යනාදියෙන් එකළ දක්වා ඇත්තේ මොනවාද?

B - තමන් නුදුටු ලංකාව ගැන කෘතියක් ලියූ චීන ජාතික හිමි නම කවුද?

C - වැව් පද්ධතියකට අයත් ගම් නියෝජනය කරන තැනැත්තා කවුද?

D - මිනිසා හා අශ්ව හිස මූර්තිය දක්නට ඇත්තේ කොහේද? (ලකුණු 4)

(ඇ) A සහ B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අනුපිළිවෙළින් පිළිතුරු පත්‍රයේ ලියන්න.

A



B

(i) මෙය සොයාගෙන ඇත්තේ කුමන ස්ථානයකින් ද?

(ii) එය කුමන ඓතිහාසික යුගයට අයත් ද?

(iii) මෙය නිර්මාණය කර ඇත්තේ මොනවායින් ද?

(iv) මේවා පැළඳ ඇත්තේ කෙබඳු අයද?

(ලකුණු 4)

(i) B රූපයෙන් දැක්වෙන්නේ කුමක් ද?

(ii) මෙය ඉදිකර ඇති ප්‍රදේශය කුමක් ද?

(iii) මෙය සම්බන්ධ වන ඔය නම් කරන්න.

(iv) මෙම නිර්මාණයට යොදාගෙන ඇති අමුද්‍රව්‍ය නම්කරන්න.



(ලකුණු 4)

## II කොටස

- ප්‍රශ්න හතරකට පිළිතුරු ලියන්න.

(02) (i) ප්‍රාග් ඓතිහාසික යුගයේ ඉරණමඩු සැකැස්මට අයත්
A - පහතරට වියළි කලාපීය ලෙන් දෙකක්
B - පහතරට තෙත් කලාපීය ලෙන් එකක් නම් කරන්න. (ලකුණු 03)

(ii) A - පූර්ව ඓතිහාසික යුගය යනුවෙන් සැලකෙනුයේ කවර කාල පරිච්ඡේදයක් ද?
B - මැටි ඔරු සුසානභූමි හමු වූ ස්ථාන දෙකක් ලියන්න. (ලකුණු 04)

(iii) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තියට බලපෑ භෞතික සාධක දෙකක් නම් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) පූර්ව ඓතිහාසික යුගයේ ජීවත් වූ මානවයා තාක්ෂණය භාවිත කළ ආකාර කරුණු තුනක් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(03) (i) සිතුල්පව්ව කොරවක්ගල ප්‍රදේශයේ ගල් ගුහාවකින් තොරතුරු ලැබෙන ගම්කයන් තිදෙනා නම් කරන්න. (ලකුණු 03)

(ii) පරුමකවරයෙකු විසින් ඉටු කළ යුතු කාර්යයන් හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) දේවානම්පියතිස්ස රජු ප්‍රාදේශීය පාලකයන් මෙන්ම විදේශික පාලකයන් සමඟ සුහදව කටයුතු කළ බව කරුණු දෙකක් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) මෙරට ඉතිහාසය තුළ දුටුගැමුණු රජුට හිමිවන වැදගත්කම කරුණු තුනකින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(04) (i) පහත සඳහන් වැව් නිර්මාණය කර වූ රජවරුන්ගේ නම් අනුපිළිවෙළින් ලියා දක්වන්න. (ලකුණු 03)
A - පරාක්‍රම සමුද්‍රය    B - හුරුළු වැව    C - පදවිය වැව

(ii) පහත සඳහන් එක් එක් කරුණට සම්බන්ධ පාලකයන් කවුරුන්ද යන්න අනුපිළිවෙළින් ලියන්න.
A - තම මාමාවරුන් යටත් කොට රජකමට පත්වීම
B - විශාල වැව් ඉදි කිරීමේ ප්‍රමුඛයා
C - අනුරාධපුර රාජධානියේ අවසාන පාලකයා
D - උණ රෝගීන්ට රෝහලක් ඉදි කළ රජ (ලකුණු 04)

(iii) අතීත ශ්‍රී ලංකාවේ ගමක පාලනය සිදු වූ ආකාරය එහි නායකත්වය හා කාර්යභාරය ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) A - අතීත ශ්‍රී ලංකාවේ දියුණු යකඩ නිස්සාරණ තාක්ෂණයක් තිබූ බවට පුරාවිද්‍යාත්මක තොරතුරු ලැබෙන ස්ථාන දෙකක් සඳහන් කරන්න.
B - එම ස්ථානයන්හි යකඩ නිස්සාරණය කළ ආකාරය සැකෙවින් දක්වන්න. (ලකුණු 06)

(05) (i) අතීතයේ දිගු දුර මැනීමට යොදාගත් මිනුම් තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) A - මහවැලි ගඟට සම්බන්ධ ඇළ මාර්ග දෙකක් සඳහන් කරන්න.
B - ධාතුසේන රජතුමා සෑදූ වැව් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) අතීතයේදී මෙරට දියුණු වෛද්‍ය සේවාවක් පැවති බව කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) වැවක ප්‍රධාන කොටස් තුනක් නම් කොට එමගින් කෙරෙන කාර්යය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(06) (i) ඇළහැර ඇළෙන් ජලය ලබා ගන්නා වැව් තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) වැව් පද්ධතිය ඉදිකිරීමේ අරමුණු දෙකක් ලියා දක්වන්න. (ලකුණු 04)

(iii) අතීත වාරි කර්මාන්තයේ විශිෂ්ටත්වය කරුණු දෙකක් දක්වා පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) සීගිරි ජල මල් නිර්මාණයේදී අනුගමනය කර ඇති තාක්ෂණික ක්‍රම පැහැදිලි කරන්න. (ලකුණු 06)

(07) (i) රාජ්‍යත්ව සංකල්ප තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) පහත A, B, C, D යටතේ දක්වා ඇති විදේශ සබඳතා හා සම්බන්ධ පුද්ගලයන් වරහන් තුළින් තෝරා ලියන්න.

A - චීනය සමඟ විධිමත්ව දූත සබඳතා පැවැත්වීම
B - ක්‍රි.ව. 850 ලංකාවට පැමිණි ශ්‍රී පාදය වන්දනා කිරීම
C - රෝමානුක දේශයට තානාපතිවරු යැවීම.
D - පත්තිනි දේවාලයක් විවෘත කිරීමට චෛර රාජ්‍යයට යාම

(පළමු වන මුගලන් රජු / භාතිකාභය රජු / සුලෙයිමාන් / හයවන අග්ගබෝධි රජු / පළවන අග්ගබෝධි රජු / ඉබන් බතූතා / පළමුවන ගජබාහු රජු) (ලකුණු 04)

(iii) අතීත සමාජය තුළ විවිධ ආගමිකයින් සහජීවනයෙන් ජීවත් වූ බව උදාහරණ දෙකක් දෙමින් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) පුරාණ කාලයේ මෙරට වැසියන්ගේ දේශීය ආහාර පරිභෝජන රටාව නිරෝගිමත් දිවියකට බලපෑ අයුරු කරුණු තුනක් දක්වා පැහැදිලි කරන්න. (ලකුණු 06)

**